


# 'කොළඹ ' ශාස්ත්‍රීය සංග්‍රහය

## ලිපි සම්පාදකයන් සඳහා මාර්ගෝපදේශ

1. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා විෂය පථයට අයත් උසස් මට්ටමක ශාස්ත්‍රීය හා පර්යේෂණ ලිපි පළ කිරීම සඳහා කොළඹ ශාස්ත්‍රීය සංග්‍රහය කැප වෙයි . එමෙන්ම වෙනත් විෂය ක්ෂේත්‍රයන්ට අයත් ලිපි ද සංස්කාරක මණ්ඩලයේ තීරණය මත පළ කිරීම සඳහා සලකා බැලේ.

2. වෙනත් සඟරාවක හෝ පුවත්පතක පළ කිරීම සඳහා යොමු කරන ලද ලිපි කොළඹ ශාස්ත්‍රීය සඟරාවේ පළ කිරීම සඳහා බාර ගනු නොලැබේ.

3. මූලාශ්‍රය හා තොරතුරු අධ්‍යයනයකින් පසුව ලියවුණු සාරගර්භ ලිපි සඳහා කොළඹ ශාස්ත්‍රීය සඟරාව විවෘත ව පවතින බව සැලකිය යුතු ය. උසස් ගණයේ ශාස්ත්‍රීය ග්‍රන්ථයක් විචාරයට ලක් කරමින් ලියැවුණු ග්‍රන්ථ විචාර සඳහා ද අවස්ථාව ලැබේ.

4. **ලිපි සම්පාදනය කළ යුතු ආකාරය**

- ලිපි සම්පාදනය සඳහා Microsoft Word මෘදුකාංගය යොදා ගත යුතු අතර FM අභය ෆොනුරුවෙහි (font) 13 ප්‍රමාණය අක්ෂර සංයෝජනය සඳහා භාවිත කළ යුතු ය.
- වාක්‍ය අතර පරතරය 1.5 ප්‍රමාණය විය යුතු ය.
- A4 ප්‍රමාණයෙහි පිටුවක සතර පැත්ත අඟල් 1 බැගින් ඉඩ තැබිය යුතු ය.
- FM අභය ෆොනුරුවෙහි 14 ප්‍රමාණයේ තද කළු අකුරු (bold) ප්‍රධාන මාතෘකා / අනුමාතෘකා සඳහා භාවිත කළ යුතු ය.
- ඡේද අතර අමතර ඉඩ නොතැබිය යුතු ය.
- රූප, සිතියම් ආදිය ඇතුළත් කරන්නේ නම් ඉහළ රූපමය අගයකින් යුතු ( high resolution ) රූප පමණක් භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.
- වචන ප්‍රමාණය 3000 – 6000 අතර විය යුතු ය ( ග්‍රන්ථ නාමාවලිය හා වෙනත් සටහන් හැර)
- සෑම ලිපියක ම වචන 100 – 150ක පමණ සාර සංක්ෂේපයක් ( abstract හා ප්‍රමුඛ පද ( key words ) 4 -5 අතර තිබිය යුතු ය.
- සෑම ලිපියක් සමග ම කර්තෘගේ නම, මාතෘකාව, අධ්‍යාපන සුදුසුකම් හා ආයතනික සම්බන්ධය හා විද්‍යුත් ලිපිනය යනාදී තොරතුරු ඇතුළත් අමතර පිටුවක් එක් කළ යුතු ය.

5. මූලාශ්‍රය දැක්වීමේ දී හාවර්ඩ් ශෛලිය ( කර්තෘ - වර්ෂ ) භාවිත කළ යුතු ය. කිසියම් කරුණකට අදාළව පාදක සටහන් දක්වන්නේ නම් එම සටහන් ලිපියේ අගට එකතු කළ යුතු ය.

6. බහුල ව්‍යවහාරයේ නොමැති සිංහල පාරිභාෂික පද ( Technical terms) ලේඛකයා විසින් භාවිත කරනු ලබන්නේ නම් එහි ඉංග්‍රීසි පදය වරහන් තුළ සඳහන් කිරීම අවශ්‍ය වේ.

7. ශාස්ත්‍රීය ලේඛනයට උචිත භාෂා ස්වරූපයක් ලිපියේ භාවිත කිරීම අපේක්ෂා කෙරේ.

8. සියලු ම ලිපි සම සමීක්ෂණයට ( peer review) හා විධිමත් භාෂා සංස්කරණයකට ලක් කෙරෙන අතර සම්මත භාෂා ව්‍යවහාරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

9. 2019 වසරේ කලාපය සඳහා පළ කිරීමට අදාළ සියලු ම ලිපි **2019 ජූනි 15** පෙර ප්‍රධාන සංස්කාරක - කොළඹ ශාස්ත්‍රීය සඟරාව, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 3 යන ලිපිනයට යොමු කළ යුතු ය. ලිපියේ ඊ - පිටපතක් colomboeditor@arts.cmb.ac.lk යොමු කළ යුතු ය.

10. කොළඹ ශාස්ත්‍රීය සඟරාවේ පළ කිරීම සඳහා ලිපි තෝරා ගැනීමේ අවසාන තීරණය සංස්කාරක මණ්ඩලය සතු ය.

## සංස්කාරක මණ්ඩලය

මහාචාර්ය සඳගෝමි කෝපරහේවා ( ප්‍රධාන සංස්කාරක)
ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි
ආචාර්ය ලලිතසිරි ගුණරුවන්
ආචාර්ය අනුත්තරා දේවි විද්‍යාලංකාර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධම්ම දිසානායක
කථිකාචාර්ය සුමිත් චාමින්ද
කථිකාචාර්ය ඔසඳ ගුණරත්න